identiality nature
request.



## 1981.05.25 වෙනි දින පවත්වන ලද 1982 කෘෂිකර්ම සංගණනය පිළිබඳ සාකච්ඡාවටය

සාකච්ඡාවට සහභාගි වූ අය :

| | | |
|---|---|---|
| ඒ.ඒ.ඩී.සී.යසසිරි මයා | : | සහකාර අධ්‍යක්ෂ |
| ඩබ්.නානායක්කාර මයා. | : | සහකාර අධ්‍යක්ෂ |
| කේ.ජයසිංහ මයා. | : | සංඛ්‍යාලේඛනඥ |
| එච්.එන්.සිරිවර්ධන මයා. | : | සංඛ්‍යාලේඛනඥ |

එහිදී පහත සඳහන් තීරණ ගන්නා ලදී.

1. <u>අවශ්‍ය වන ආකෘති ප්‍රමාණය</u> :

සංගණන අංශයෙන් දැනගත් පරිදි දිවයිනේම ගෘහ ඒකක දසලක්ෂ තුනක් ඇති නිසා අපතේ යාම් ආදිය සඳහා උපලේඛන 70 දාහක් මුද්‍රණය කිරීම.

2. <u>සාමාන්‍ය උපලේඛනය</u> :

මෙවර ගොවි කාරකයන් දස ලක්ෂ 1.8 ක් පමණ වේයයි ඇස්තමේන්තු කොට සාමාන්‍ය උපලේඛන දස ලක්ෂ 2 ක් මුද්‍රණය කිරීම.

3. <u>සාරාංශ ලේඛනය</u> :

ගණන් ගන්නන් 5000 ක් පමණ යෙදවීමට බලාපොරොත්තු වන බැවින් අපතේ යාම් ආදියත් සමග 15,000 ක් මුද්‍රණය කිරීම.

4. <u>වතු උපලේඛනය</u> :

වතුවල කම්කරුවන් හා පොහොර භාවිතය වැඩිනිසා ඒ පිළිබඳ විස්තර ලබාගැනීමට සාමාන්‍ය උපලේඛනයට අමතරව තව පිටු 2 ක් ඇතුළත් කිරීම.

5. <u>උපදෙස් මාලාව</u> :

මීයවර මෙන් අවස්ථාවෙන් අවස්ථාවට උපදෙස් මාලා කීපයක් නිකුත් නොකර මෙවර පිටු 20 කින් සමන්විත එකම උපදෙස් මාලාවක් නිකුත් කිරීම එකී පිටපත් 6500 ක් පමන සෑහේ.

උපලේඛන සුරක්ෂිතව තබාගැනීම පිණිස ගණන් ගන්නන්ට ආරක්ෂිත කවරයක් දැනට වෙන් කර ඇති මුදල් වලින් ලබාදීම. ආරක්ෂිත කවරය සැකසීම පිළිබඳ මුද්‍රණ අංශයෙන් විමසීම.

6. නියදි උපලේඛනය පාටකිනුත්, සාමාන්‍ය උපලේඛනය වෙනත් පාටකිනුත් මුද්‍රණය කිරීම.

7. නියදීද තේරීම හා නියදි උපලේඛනය පිළිබඳව, තවදුරටත් පාක් මහතාගේ අදහස් විමසීමට තීරණය විය.

...2

s determines ...
fidentiality nature
request.

41

56



තවද උපලේඛන හා ප්‍රශ්නාවලිය පිළිබඳව ඒ ඒ අයගේ අදහස් විමසා අදාල ආයතන වලට කලින් දැනුම් දුන්නත්, සමහර ආයතන ඒ ගැන එතරම් උනන්දුවක් නොදක්වා තිබීම නිසා දෙවෙනි වතාවටත් අවශ්‍යම ආයතන සේ සැලකෙන තේ මංඩලය, පොල් මංඩලය, රබර් පාලක දෙපාර්තමේන්තුව, මධ්‍යම බැංකුව යන ආයතන වල අංශ ප්‍රධානීන් හමුවී ඔවුන්ගේ අදහස් ද ගෙන අලුතෙන් යමක් ඇතුලත් කිරීමට වුවහොත් අප දැනට සකසා ඇති උපලේඛනය වෙනස් නොකොට එහි හිස්ව තිබෙන අවසන් පිටුවේ අමතර දේ ඇතුලත් කිරීම සුදුසු බව තීරණය විය.

8. <u>අප ගත් තීරණයන් ක්‍රියාත්මක වන අයුරු</u> :

එෆ්.1 හි අදාල තීරණය කොතෙක් දුරට නිවරදද යන්න අප දැන සිටිය යුතුයි. එනිසා එෆ්.1 පෝරම පරීක්ෂා කොට ඒ පිළිබඳව ක්ෂේත්‍රයට ගොස් තවදුරටත් එහි නිවරදතාවය තහවුරු කර ගත යුතුයි. ඒ කොටස කිරීමට සංඛ්‍යාලේඛනඥ එච්.එන්.සිරිවර්ධන මහතාට පැවරින.

9. සාමාන්‍ය උපලේඛනයේ දෙවන කොටසේ දෙවන කොටුව ඒ අයුරුම ගැනීමට තීරණය විය.

10. තුන්වන කොටස් දි අනෙකුත් ගොඩ ඉඩම් පිළිබඳව දැක්වීමේදී විස්තරාත්මකව බෙදා දැක්වීම, මෙහිදී අපහසු නිසාත් එවැනි විස්තරාත්මක විශ්ලේෂණයක් විග්‍රහයක් නියැද්දේම ලැබෙන නිසාත් ඒය මේ අයුරුම ගැනීමට තීරණය වූ අතර, කොකෝවා හා කුරුඳු මෙයට ඇතුලත් කිරීමට තීරණය විය. කොකෝවා ගස්යට වගාවක් නිසා එහි එහි බිම් ප්‍රමාණය මුලු බිම් ප්‍රමාණයට එකතු නොවන ලෙස වක්‍රය සෑදීමටද තීරණය විය.

11. පස්වන කොටසේ පොහොර යෙදවීම රාත්තල් ප්‍රමාණයද මෙහි අසා ඇති හෙයින් දැනට භාවිතා වන මෙට්‍රික් ක්‍රමය නිසා ගණන් ගන්නාගේ පහසුව පිණිස කිලෝ හා රාත්තල් ප්‍රමාණය සැසඳීමේ වක්‍රයක් උපලේඛනයේම අදාල ප්‍රශ්නය කෙලවර කුඩාවට මුද්‍රණය කිරීමට තීරණය විය.

12. හයවන කොටසේ දි බිම් ප්‍රමාණය, ගොවි කාංඩයේ මුලු බිම් ප්‍රමාණයට සමාන හෝ අඩුවිය යුතුයි.

සාමාන්‍ය උපලේඛනයේදි මෙම වාරිමාර්ග ක්‍රම තිබේද නැද්ද යන්න අංක පමණක් සඳහන් කොට එහිදි නළලින් ආදියේ ගණන් ගැනීමක් ප්‍රමා ණවත් වන අතර නියැද්දේ දි යල මහ වශයෙන් වෙන්කොට විස්තර ලබා ගැනීමත් ප්‍රමාණවත් වේ යනු නිගමනය කරන ලදි.

13. <u>හත්වෙනි කොටස</u>:

ගොවි උපකරන ලබා ගන්නට ඇති හැකියාව පිළිබඳව දැන ඒවා ප්‍රයෝජනයට ගත්තාද නැද්ද යනු විමසා එය තමාගේමද, නැතිනම් වෙනත් අයකුගෙන් කුලියට ලබා ගත්තක්ද එසේත් නැතිනම් වෙනත් ක්‍රමයකින් ලබා ගත්තක්ද වශයෙන් විස්තර වන පරිදි තිරස්තිරු වෙනස් කිරීම සුදුසු බව තීරණය විය.